# නව වෙනසක් වෙනුවෙන් : 2019 වසරේ ජාත්‍යන්තර කාන්තා දිනය සමරමින් යුරෝපා සංගමය ස්ත්‍රී පුරුෂත්වය පිළිබඳව සංසඳයක් පැවැත්වීය.

**''නව වෙනසක් වෙනුවෙන් සමව සිතන්න - දක්ෂව නැගීසිටින්න''** යන තේමාව අභිලාශය කර ගනිමින් යුරෝපා සංගමය (EU) ශ්‍රී ලංකාව තුල ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ගොඩනැංවීම හරහා ශ්‍රී ලංකාව තුල සාමය ගොඩනැගීමට ප්‍රවේශයක් ලබා ගැනීම වෙනුවෙන්, මාර්තු 8 වනදාට යෙදෙන ජාත්‍යන්තර කාන්තා දිනය නිමිති කොට ගෙන ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය පිළිබඳව සංසඳයක් පැවැත්වීය.

උතුරු නැගෙනහිර පළාත්වල කාන්තාවන් පුද්ගලික ජීවිතයේදී සහ සාමාන්‍ය ජීවිතයේදී මුහුණ දෙන සම අවස්ථාවන් අභිමිවීම පිළිබඳව අධ්‍යනය කරමින් ඒවා විසඳීම සඳහා දියත් කල යුරෝපා සංගම් මුදල් සම්පාදනයෙන් ක්‍රියාත්මක කෙරෙන ව්‍යාපෘති 10ක, හවුල්කාර සංවිධාන දහයක් මෙම සංසඳයට සහභාගී වූහ.

මෙහිදී යුරෝපා සංගමයේ ගරු තානාපති තුන්ග් ලායි මාග් මහතා සඳහන් කළේ ''යුරෝපා සම්මුතීන්ට අනුව ''ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය''ට ඉහළ වටිනාකමක් හිමිවන බවත් එය දේශපාලනමය, තිරසාර සංවර්ධන සහ ආර්ථික වර්ධනය කිරීමෙහිලා ප්‍රධානම බලවේගයක් බවත් ය. තවද, කාන්තාවන් අත්විඳින ගැටළු සම්බන්ධව කටයුතු කිරීම අපගේ සංවර්ධන ව්‍යාපෘතිවල අංගයක් බවත් ඒ වෙනුවෙන් මුලාධාර සපයන ව්‍යාපෘති ඇති කිරීම ශ්‍රී ලංකාව තුළ පමණක් නොව ලෝකය පුරාම යුරෝපා සංගමය වැඩසටහන් ක්‍රියාත්මක කරමින් විශාල සේවාවක් සිදු කරමින් සිටින බවත් තානාපතිවරයා වැඩි දුරටත් අදහස් දක්වමින් ප්‍රකාශ කළේය.

කාන්තාවන්ගේ ආර්ථික අයිතිවාසිකම් නංවාලීමට සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මූලික කරගෙන ඇතිවන හිංසන වලට එරෙහිව ක්‍රියා කිරීමට ඌව සහ මධ්‍යම පළාතේ කාන්තාවන් දැනුම්වත් කිරීම සඳහා 2018 වසරේ දෙසැම්බර් මාසයේ යුරෝපා සංගමයේ හවුල්කාරිත්වයෙන් පැවති මෙවැනිම වැඩසටහනක දිගුවක් ලෙස මෙම සංසඳය පවත්වනු ලැබිණි.

**මාධ්‍ය විමසීම් සඳහා :**

**දේශපාලන වෙළඳ සහ සන්නිවේදන අංශය**

**යුරෝපා සංගමයේ ශ්‍රී ලංකා සහ මාලදිවයින් නියෝජිත මණ්ඩලය**

**දූරකථන : +94 11 2674413-4**